**ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 මැයි 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 707.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 629.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 77 .49 ක් හෙවත් සියයට 10.96 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 607.00 | 600.29 | 6.71 | 1.11 |
| මූලධන | 100.00 | 29.22 | 70.78 | 70.78 |
| **එකතුව** | **707.00** | **629.51** | **77.49** | **10.96** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 18ක් විසින් එකතුව රු.මිලියන 2,812 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 2,496 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 316 ක් හෙවත් සියයට 11 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 44.16 | 43.18 | 31.00 | 41.53 | 144.00 | 136.59 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේවන තැන්පත් ගිණුම් 4 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 527 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6003/0000/00/0002/0067/000 | 17.62 |
| 6003/0000/00/0013/0037/000 | 76.44 |
| 6003/0000/00/0017/0004/000 | 34.42 |
| 6003/0000/00/0016/0019/000 | 398.62 |
| **එකතුව** | **527.10** |

**2.4 විගණන නිරීක්ෂණය**

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | විදුලිඋපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |
| (උ) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |
| (ඌ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

## 3.2 විසර්ජන ගිණුම

------------------

**අයවැය විචලනය**

--------------------

වැය විෂයන් 11 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය එම වැය විෂයන්වල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 59 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක පැවති වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණු රු.181,944,766 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් ඉදිරි වර්ෂයේදී වැයකිරීමට සැලැසුම් කළ රු. 4,262,500 ක්, මුදල් රෙගුලාසි 215 ප්‍රකාර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය පරිදි එදිනට අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු.531,526 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 3 ක සිට වර්ෂ 6 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වින විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) ණය අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය හා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ණය පාලන ගිණුමේ අවසාන ශේෂය අතර රු.953,123 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

### 3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.6 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ජපන් රජයේ ආධාර යටතේ ලැබී තිබූ යතුරුපැදිය සහ ට්‍රේලර් බවුසරය දිරාපත්වීම සම්බන්ධයෙන් විගණනයෙන් පෙන්වාදීමෙන් පසු 2013 ජුනි 20 දිනැති අංක HAF /01/09 /විවිධ දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව බවුසර් රථය මාස 03 ක් ඇතුළත ප්‍රාදේශීය සභාවට භාරදෙන ලෙසත්, යතුරු පැදිය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගන්නා ලෙසත් දන්වා තිබුණද , 2015 දෙසැම්බර් 01 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේ දී ඇස්තමේන්තු කර රු.මිලියන 76.7 ක් වැයකර පහත සඳහන් ඉදිකිරීම් සිදුකර තිබුණි. අදාළ යටිතල පහසුකම් සම්පූර්ණ නොකිරීම නිසා එම ගොඩනැගිලි 2016 පෙබරවාරි 05 දින වන විටත් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දී නොතිබුණි.

| වත්කම් වර්ගය | ඇස්තමේන්තුගත වටිනාකම<br>රු. | කළ වැඩ වටිනාකම<br>රු. | නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතීමට හේතුව |
|---|---|---|---|
| වරකාපොල සතිපොල පළමු අදියර | 28,500,000 | 22,765,600 | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සිදුකර තිබුණද, යටිතල පහසුකම් සම්පූර්ණ කර නොතිබුණි. |
| වරකාපොල සතිපොල දෙවන අදියර | 12,713,100 | 9,323,150 | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සිදුකර තිබුණද, යටිතල පහසුකම් සම්පූර්ණ කර නොතිබුණි. |
| රඹුක්කන වෙළඳ සංකීර්ණය | 35,246,264 | 21,877,271 | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සිදුකර තිබුණද, යටිතල පහසුකම් සම්පූර්ණ කර නොතිබුණි. |
| කුරගල මාතෘ සායනය | 12,154,326 | 12,154,326 | වෛද්‍යවරයෙකු නොමැතිවීම. |
| **එකතුව** | **99,197,379** | **76,704,036** | |

**3.7 අනුකූල නොවීම**

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| • XIX පරිච්ඡේදයේ 6(2) උපවගන්තිය | - | කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් නිල නිවාසය 2000 ජුනි 28 දින රජයේ නිලධාරියෙකු නොවන පුද්ගලයෙකු වෙත ලබාදී තිබුණු අතර 2016 මාර්තු 20 දින වන විටත් නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| • XIX පරිච්ඡේදය 7 හා 9 වගන්ති | - | රජයේ විධායක නිලධාරියෙකු වෙත ලබා දුන් නිල නිවාස සන්තකය ආපසු භාරදී නොතිබීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| • XIX පරිච්ඡේදය 5 (4) උපවගන්තිය | 12,319 | 2012 සැප්තැම්බර් 20 දින සිට 2015 දෙසැම්බර් 17 දින දක්වා නිල නිවසේ පදිංචිව සිටි අතර නිලධාරියාගේ හිඟ නිවාස කුලියද, හිඟ දුරකථන ගාස්තුද අයකර ගෙන නොතිබුණි. |
| • XIX පරිච්ඡේදය 6 වගන්තිය | 124,250 | නිලධාරියා විසින් රු.99,400 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ කාර්යාලයට ආපසු භාර දී නොතිබුණු අතර එම භාණ්ඩවල වටිනාකමට සියයට 25 ක එකතුකර අයකරගෙන නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

මාසික ඉපයීම් සීමාව 2015 අප්‍රේල් 01 දින සිට රු.62,500 ඉක්මවන නිලධාරින්ගෙන් උපයන විට ගෙවීමේ බදු අයකළ යුතු වුවද, ගලිගමුව ප්‍රාදේශීය ලේකම්වරයාගේ මුළු ඉපයීම් සීමාව ඉක්මවා තිබුණත්, එම නිලධාරියාගෙන් උපයන විට බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.50,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද , අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම සිදුකර නොතිබුණි.

(ආ) **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

(i) උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදී තිබූ දැරණියගල බස් නැවතුම්පල ඉදිකිරීම් ව්‍යාපෘතිය භෞතික පරීක්ෂණ අවස්ථාවේදී එක් ගොඩනැගිල්ලක බිම්මහල කපරාරු මට්ටම දක්වා නිම කර තිබූ අතර එම බිත්ති පිපිරීමට ලක්වී තිබුණි. අනෙක් ගොඩනැගිල්ල කුළුණු මට්ටමින් නවතා තිබුණි. මේ සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.44,801,291 ක් වූ අතර විගණිත අවස්ථාව වන විට රු.17,372,894 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි.

(ii) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ආරම්භ කළ තුත්තිරිපිටිය බස්නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.23,270,905 ක් වූ අතර එම කටයුතු ඉටුකිරීම උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදී තිබුණි. මෙම ව්‍යාපෘතිය විගණිත අවස්ථාව වනවිට රු.9,961,591 ක වැය කර බිම් මහල සඳහා කොන්ක්‍රීට් තට්ටුව පමණක් දමා තිබුණි. ඉතිරි වැඩ ඉටු නොකර ව්‍යාපෘතිය අතහැර තිබුණි.

(iii) 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද දුනුගම මාකඩවර මාර්ගය කිලෝමීටර් 3.25 ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු වැඩ වටිනාකම රු.89,462,048 ක් වී තිබුණි. විගණන අවස්ථාව වනවිට කිලෝමීටර් 2.10 ක ප්‍රමාණය පමණක් වැඩ නිමකර කර්මාන්තය අතහැර තිබුණි. ඒ සඳහා රු.40,219,565 ක් වැයකර තිබුණි. කර්මාන්තය සම්පූර්ණ වශයෙන් නිම නොකිරීම හේතුවෙන් මෙම මාර්ගය අරමුණු ගත කාර්යයට යොදවා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

(iv) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සබරගමුව පළාත් සභාව මගින් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් සඳහා රු.125,546,950 ක ප්‍රතිපාදන සළසා තිබුණි. අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මා ඔය හරහා ඉදිකිරීමට නියමිතව තිබූ මා ඔය අඩි පාලම සඳහා රු.3,984,096 ක ඇස්තමේන්තුවක් මත 2014 වර්ෂයේදී රු.748,415 ක් හා 2015 වර්ෂයේ රු.72,164 වශයෙන් එකතුව රු.820,579 ක් ගෙවා තිබුණි. 2016 පෙබරවාරි 29 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී යෝජිත අඩිපාලමේ ප්‍රධාන මාර්ගය පැත්තේ ඉවුරේ කණුවක් සහ ඔය මැද කණුවක් පමණක් ඉදිකර ව්‍යාපෘතිය අතර මඟ නවතා තිබුණි.

(v) 2014 වර්ෂයේදී ඇස්තමේන්තු කර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද නූරිය බස්නාගල පල්ලෙබාගෙ පාර කිලෝමීටර් 4.9 ක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තුගත වැඩ වටිනාකම රු.130,045,804 ක් වී තිබුණි. විගණන අවස්ථාව වන විට කිලෝමීටර් 3.4 ක ප්‍රමාණය පමණක් වැඩ නිමකර කර්මාන්තය අතහැර තිබුණි. ඒ වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු.61,260,893 ක් වැයකර තිබුණි.

(vi) 2014 වර්ෂයේදී ඇස්තමේන්තු කර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද, අරණායක පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තයට අදාල ඇස්තමේන්තුගත පිරිවැය රු.81,672,745 ක් වී තිබුණි. කුළුණු පාදම පමණක් දමා වැඩ නවතා තිබූ මෙම ඉදිකිරීමෙහි භෞතික ප්‍රගතිය සියයට 10 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 20 ක් හෙවත් රු.13,559,594ක් වී තිබුණි.

(vii) 2014 වර්ෂයේදී ඇස්තමේන්තු කර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද ඍජු කොන්ත්‍රාත්කරුවන් වෙත භාරදුන් ව්‍යාපෘතියක් වූ බුලත්කොහුපිටිය බස්නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.24,028,490 ක් වී තිබුණි. විගණන අවස්ථාව වන විට බිම් මහලේ බිත්ති බැඳීම, ඉහළ මහලෙහි බිත්ති බැඳ වහලය සවිකිරීම යන වැඩ කොටස් පමණක් ඉටුකිරීමට රු.11,682,760 ක් වැයකර තිබුණි. ඉතිරි වැඩ කොටස් ඉටු කිරීමකින් තොරව ව්‍යාපෘතිය නවතා තිබුණි.

(ඇ) **ඉටු නොකරන ලද ව්‍යාපෘති**

-------------------------------

වර්ග අඩි 9092 ක්වූ තට්ටු 06 කින් සහ වර්ග අඩි 2320 ක තට්ටු 04 කින් සමන්විත නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඇස්තමේන්තුගත වටිනාකම රු.495,000,000 ක් වී තිබුණි. 2010 ජූලි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඒ සඳහා අනුමැතිය ලැබී තිබුණි. එක්තරා ඉදිකිරීම් සමාගමක් වෙත රු.294,982,342 කට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පවරා රු.91,934,156 ක අත්තිකාරම් ගෙවා තිබුණි. එම ස්ථානයේ පස්කපා මට්ටම් කිරීමට වෙනත් ඉදිකිරීම් ආයතනයකට අවස්ථා 03 කදී රු.2,850,123 ක් ගෙවා තිබුණි. 2014 මැයි 10 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතුව තිබුණද, 2016 මැයි 17 දින වන විටත් තට්ටු 06 කින් සමන්විත වර්ග අඩි 9092 ක ගොඩනැගිල්ලේ මහල් 3 ක කොන්ක්‍රීට් කණුමත කොන්ක්‍රීට් තට්ටු 3 ක් පමණක් සකසා ඉදිකිරීම් කටයුතු අතරමග නවතා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගොඩනැගිල්ලේ ඉදිරිපස හා පිටුපස පඩිපේළි සඳහා බඳින මුළු කම්බි ප්‍රමාණයම දිරාපත් වී තිබුණි.

(ii) බිම් මහල මැදින් පොළොව පුපුරා තිබුණි.

(iii) කයිරු තලාද නිමකර නොතිබුණි.

(iv) ව්‍යාපෘතියේ උපදේශන සේවාව සඳහා බිල් සහතික කිරීම වෙනුවෙන් හා මූලික උපදේශන කටයුතු වෙනුවෙන් (ඉහත සඳහන් පරිදි ගොඩනැගිලි දෙකම ඉදිකිරීම සඳහා උපදේශන ගාස්තු වශයෙන්) ගිවිසුම්ගත මුදල රු.15,000,000 ක් වී තිබුණි. ව්‍යාපෘතිය අත්හිටුවන අවස්ථාව වන විට ඉන් රු.9,892,500 ක් ගෙවා තිබුණි. තවත් රු.4,262,500 ක් ගෙවීම සඳහා පොදු තැන්පත් ගිණුමේ එම මුදල තැන්පත් කර තිබුණි. මෙම ගොඩනැගිලි දෙකම ඉදිකිරීම සඳහා වන ගිවිසුම්ගත උපදේශන ගාස්තුවෙන් සියයට 94 ක් වැය කර තිබූ අතර එම සේවාව ලබා ගෙන තිබුණේ ගොඩනැගිලි දෙකෙන් තට්ටු 6 කින් යුත් එක් ගොඩනැගිල්ලක කණුමත කොන්ක්‍රීට් තට්ටු 3 ක් දැමීම සඳහා පමණි.

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) බොරලංකඩ මාතෘ සායන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් රු.11,360,262 ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත රාජ්‍ය සංස්ථාවක් විසින් උප කොන්ත්‍රාත් පැවරුම් ක්‍රමය යටතේ උප කොන්ත්‍රාත්කරුවකු වෙත භාරදී තිබුණි. 2016 පෙබරවාරි මාසයේදී භෞතික පරීක්ෂණ අවස්ථාව වනවිට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් හෙවත් රු.4,646,890 ක් වැය කර තිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිවාරම දමා අඩි 04 ක පමණ බිත්ති බැඳ ව්‍යාපෘතියේ වැඩ නවතා තිබුණි.

(ii) බුලත්කොහුපිටිය සතිපොළ ඉදිකිරීම් ව්‍යාපෘතිය රු.34,911,653 ඇස්තමේන්තුගත පිරිවැයක් මත රාජ්‍ය සංස්ථාව විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදී තිබුණි. භෞතික පරීක්ෂණ අවස්ථාව වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල මූල්‍ය ප්‍රගතිය සියයට 17 ක් හෙවත් රු.6,096,970 ක් පැවති අතර ඉදිකිරීම්වල ප්‍රගතිය අත්තිවාරම දමා කුළුණු සිටුවා යකඩ බාල්ක සැපයීම දක්වා සිදුකර ව්‍යාපෘතියේ වැඩ නවතා තිබුණි.

(iii) බුලත්කොහුපිටිය ආදාහනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.21,798,622 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ආරම්භ කර වැඩ නවතා තිබූ පසුව උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදී තිබුණි. විගණන අවස්ථාව වනවිට එහි මූල්‍ය ප්‍රගතිය රු.11,457,845 ක් හෙවත් සියයට 53 ක් වී තිබුණි. කර්මාන්තයේ භෞතික ප්‍රගතිය පරීක්ෂාවේදී ගොඩනැගිලි ඉදිකිරීම සම්පූර්ණ කර තිබුණද, ඊට අදාල ප්‍රධාන වැඩ කොටස් වන වීම්නිය හා උදුන සවිකිරීම සිදුකර නොතිබුණි.

(iv) දිප්පිටිය සති පොළ ඉදිකිරීමේ කර්මාන්තයේ පළමු අදියර සහ දෙවන අදියර සඳහා පිළිවෙලින් රු.12,819,040 හා රු.8,298,276 ක් වශයෙන් ඇස්තමේන්තු පිළියෙළ කර තිබුණි. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 2015 වර්ෂයේ දී ඒ සඳහා ප්‍රතිපාදන සළසා තිබුණි. රාජ්‍ය සංස්ථාව විසින් උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත භාරදී තිබූ මෙම කර්මාන්තවල 2016 පෙබරවාරි මාසයේදී සිදුකළ පරීක්ෂාවේදී එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.5,204,290 ක් හෙවත් සියයට 41 හා රු.4,617,757 ක් හෙවත් සියයට 56 ක් වුවද භෞතික පරීක්ෂාවේදී අත්තිවාරම දමා කුළුණු 18 ක් පමණක් ඉදිකර කර්මාන්තය අතහැර තිබුණි.

(v) 2014 වර්ෂයේදී ඇස්තමේන්තු කර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද කහවන්දල මාර්ගය කිලෝමීටර් 4.9 ක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු වැඩ වටිනාකම රු.93,827,559 ක් වී තිබුණි. විගණිත අවස්ථාව වනවිට කිලෝමීටර් 0.8 ක ප්‍රමාණය පමණක් වැඩ නිමකර රු.32,387,559 ක් ගෙවා පසුව කර්මාන්තය අතහැර තිබුණි. කර්මාන්තය සම්පූර්ණ වශයෙන් නිම නොකිරීම හේතුවෙන් මෙම මාර්ගය අරමුණුගත කාර්යයට යොදවා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

(vi) 2014 වර්ෂයේදී ඇස්තමේන්තුකර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද මාලියද්ද මීපිටිවල මාර්ගය කිලෝමීටර් 2 ක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු වැඩ වටිනාකම රු.53,567,628 ක් වී තිබුණි. විගණන අවස්ථාව වනවිට කිලෝමීටර් 0.4 ක ප්‍රමාණයක පමණක් වැඩ නිමකර කර්මාන්තය අතහැර තිබූ අතර ඒ වන විට රු.15,258,123 වැයකර තිබුණි.

(vii) 2014 වර්ෂයේදී ඇස්තමේන්තු කර 2015 වර්ෂයේ අවිච්ඡේද කරන ලද සුදුගල හංදිය ඇරම්පල විල්ලන්ගොඩ මාර්ගය කිලෝමීටර් 3 ක ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු වැඩ වටිනාකම රු.75,213,407 ක් වී තිබුණි. විගණන අවස්ථාව වනවිට කිලෝමීටර් 1.7 ක ප්‍රමාණයක් පමණක් වැඩ නිමකර කර්මාන්තය අතහැර තිබුණි. ඒ වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු.28,844,232 ක් වැයකර තිබුණි.

## 3.9 කාර්යසාධනය

---------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේ කොරියානු රජයේ ආධාර මත රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කහඹිලියාගොඩ ගම්මානයේ සෙටාවුල් උණ්ඩුන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති 6 ක් වෙනුවෙන් රු.3,409,074 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ව්‍යාපෘති 2015 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව 2015 වර්ෂය සඳහා ලබාදීමට එකඟ වී තිබූ ඇමරිකානු ඩොලර් 110,000 ක මුදල අත්හිටුවීමටත්, 2015 වර්ෂයේ අළුත් ව්‍යාපෘති 02 ක් හා ඉදිරි වර්ෂ 2 තුළ නව ව්‍යාපෘති 6 ක් ඇතුළත් කරමින් ව්‍යාපෘතීන් පුළුල් කරමින් ලබාදීමට නියමිත ආධාර මුදල් අවලංගු කිරීමට සිදුවන බවද එම ආයතනය විසින් අවධාරණය කර තිබුණි.

(ආ) මව්වරුන්ට මාසික පෝෂ්‍යදායී ආහාර ලබාදීමේ වැඩසටහන යටතේ 2015 දෙසැම්බර් 09 දින වන විට රු.9,507,000 ක ප්‍රතිපාදන රඹුක්කන ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. ඉන් රු.7,942,000 ක් මාර්තු මාසයේ සිට ජුනි මාසය දක්වා වියදම් කර තිබුණි. ඉතිරි රු.1,565,000 ක් ඉදිරි මාස 5 සඳහා ප්‍රමාණවත් නොවන බවත්, අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සඳහා ඉල්ලීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකළ යුතු වුවත්, එසේ කර නොමැති බැවින් විගණන දිනය වන 2015 දෙසැම්බර් 09 දින වන විටත් ඉදිරි මාස 5 සඳහා පෝෂණ ආහාර මල්ල බෙදාදී නොතිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව සිදු කළ අවස්ථා අනාවරණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති 14 ක වැඩ ආරම්භ කර පසුව වැඩ නවතා තිබුණි. 2015 වර්ෂයේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව රාජ්‍ය සංස්ථාව වෙත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පවරා තිබුණි. එම සංස්ථාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව හා විධිමත් හැකියා සහතිකයක් ලබා ගැනීමකින් තොරව උප කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා දී තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.2 මාර්ගෝපදේශය අනුව ලංසුකරුවකුට අවශ්‍ය වන සියලු තොරතුරු ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගත විය යුතු වුවද , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගැනීම්වලදී මිල කැඳවීම් ලිපිවල ලංසු කැඳවුම්කරුවන්ට අවශ්‍ය මිල ගණන් කැඳවන භාණ්ඩයේ පිරිවිතර ,මිල ගණන් එවිය යුතු අවසන් දිනය හා වේලාව, මිල ගණන් එවිය යුතු ක්‍රමය, මිලගණන් එවිය යුත්තේ කා වෙත ද යන තොරතුරු ලංසු කැඳවීම් ලිපිවල ඇතුළත් කර නොතිබුණි.

## 3.11 මූල්‍ය අක්‍රමිතා ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝගම මාතෘ සායනය ඉදිකිරීමට අදාල ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක ජී 02 ට හා ජී ඩී ට අදාළ වැඩ කොටස් කිසිවක් ඉටු කර නොතිබුණි. 2014 දෙසැම්බර් 20 දින වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 498,334 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) ගල්බොක්ක මාතෘ සායන ගොඩනැගිලි ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය 20 කට අදාළව කිසිම වැඩ විෂයයක් ඉටු නොකර තිබියදී ඒ සඳහා රු. 619,426 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ දින 100 විශේෂ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගම නගා සිටුවීමේ 2015 වැඩසටහන යටතේ පහලගම දේවාල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ඇතුළත් කර තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් 220 ක් වෙනුවෙන් මාර්ගය දික් අඩි 212 ක් කොන්ක්‍රීට් කිරීම සඳහා රජයේ දායකත්වය රු.300,000 ක් හා ප්‍රජාදායකත්වය රු.75,000 ක් වශයෙන් රු.375,000 ක ඇස්තමේන්තුවක් 2015 ජුනි 22 දිනට සකස් කර තිබුණි. එසේ වුවද, පහලගම ගොවි සංවිධානයේ ඉල්ලීම මත එම ඇස්තමේන්තුව සංශෝධනය කර ප්‍රජාදායකත්වය රහිතව රජයේ දායකත්වය පමණක් යොදා නැවත ඇස්තමේන්තුවක් රු.294,000 කට 2015 සැප්තැම්බර් 10 දින සකස් කර එකී සමිතියට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. සංශෝධිත ඇස්තමේන්තුවට අනුව මාර්ගයේ දුර අඩි 160 ක් වූ අතර එය පෙර ඇස්තමේන්තුවට වඩා අඩි 52 ක් අඩු කර තිබුණි. දෙවන ඇස්තමේන්තුවේ දික් අඩියක පිරිවැය රු.458 ක් වැඩිපුර ඇස්තමේන්තු කිරීම හේතුවෙන් පිරිවැය 73,424 කින් වැඩි වී තිබුණි.

(ඇ) පළාත් පුර නැගුම වැඩසටහන යටතේ යටන්වල කන්ද පාර ගල් ළිඳ අසල සිට ඉදිරියට ඇති බෑවුම කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ විෂය අංක 02 යටතේ මාර්ග තලය මට්ටම් කිරීම සඳහා ABC මිශ්‍රණය යෙදීම වෙනුවෙන් රු.11,862 ක් ගෙවා තිබුණි. එම මාර්ගය සඳහා ABC මිශ්‍රණය යොදා නොතිබුණි.

(ඉ) යටන්වල විහාරස්ථානය අසල මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම් කර්මාන්තයේ වැඩ විෂය අංක 06 පරිදි ජලය බැස යාම සඳහා 1'-6" විෂ්කම්භය සහිත හියුම් පයිප්ප සපයා සවිකිරීම සඳහා දිග අඩි 08 ක් වෙනුවෙන් රු.11,680 ක් ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, හියුම් පයිප්ප සපයා සවිකර නොතිබුණි.

(ඊ) වැඩ විෂය අංක 03 යටතේ 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් උපදෙස් පරිදි සක්ක ගල් බැම්මේ දිග් අඩි 140 ක් කපරාරු කිරීම සඳහා ඇස්තමේන්තු කර දිග් අඩි 110 ක් සඳහා ගෙවීම් කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී සක්ක බැම්මේ දිග අඩි 95 අඟල් 10 ක් පමණක් විය. මේ අනුව රු.61,493 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(උ) තල්වත්ත පන්සල හරහා කොටළුකන්ද මාර්ගයේ දුෂ්කර ස්ථාන 02 ක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් වූ සැලැස්ම අනුව දික් අඩි 120 ක් කොන්ක්‍රීට් කර තිබුණත් වාර්තාව අනුව වැඩ විෂය 3 යටතේ දික් අඩි 254 ක් සඳහා ගෙවීම් කර තිබුණි . එමෙන්ම ඉතිරි දිග අඩි 134 ක ප්‍රමාණය භෞතික පරීක්ෂාවේදී සැලැසුමේ (සිතියමේ) නොමැති වෙනත් මාර්ගයක පිහිටි ස්ථානයක් පෙන්වූ අතර එම ස්ථානයන් දක්වා ඇති මිනුම් වාර්තාවට වඩා දික් අඩි 2 කින් අඩු වී තිබුණි.

### 3.12 පාඩු හා හානි

--------------

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයට රිය අනතුරකින් අලාභ හානි සිදුකර තිබුණි. අධිකරණය විසින් පුද්ගලයකු වැරදිකරුවකු කර තිබු නමුත් තවදුරටත් අයවිය යුතු රු.110,050 ක් ඔහුගෙන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.13 කළමණාකරණ දුර්වලතා

--------------------------

මාර්ග ඉදිකිරීමේදී දෙපස ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ වන්දි මුදල් ගෙවීම සඳහා රු.2,163,050 ක් විවිධ රාජ්‍ය ආයතන වෙතින් ලැබී තිබුණි. එම මාර්ගවල ඉදිකිරීම් කටයුතු සියල්ල නිමකර තිබුණද, අදාල ඉඩම් හිමියන් වෙත එම වන්දි මුදල් නොගෙවා තැන්පතු ගිණුමේ රඳවා තබා ගෙන තිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 38 | 5 | - |
| (ii) | තෘතියික මට්ටම | 30 | 23 | 7 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,047 | 1,014 | 38 | 5 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 106 | 112 | 06 | 12 |
| | **එකතුව** | **1,226** | **1,187** | **56** | **17** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන නිලධාරී 37 දෙනෙකුද, ආර්ථික සංවර්ධන නිලධාරී 38 දෙනෙකු හා සංවර්ධන නිලධාරී 07 දෙනෙකු අතිරික්තව පැවති අතර අත්‍යවශ්‍ය තනතුරු වූ කාර්මික නිලධාරී, භාෂා පරිවර්තක, ග්‍රාම නිලධාරී, තොරතුරු සන්නිවේදන වැනි තනතුරු 06 කට අදාළව පුරප්පාඩු 07 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. සංවර්ධන නිලධාරී තනතුරු 07 ක් , තාක්ෂණ සහකාර තනතුරක්, ආර්ථික සංවර්ධන නිලධාරී තනතුරු 38 ක් හා සංවර්ධන නිලධාරී තනතුරු 37 ක් සඳහා පත්වීම් ලබාදී තිබුණද, එම තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් දෙපාර්තමේන්තුගත පත්වීම්වලට අදාල දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරින් 47 ක් කාර්යාලයේ හා ක්ෂේත්‍රයේ සේවය නියුතු සංවර්ධන නිලධාරීන් 70 ක් හා සමෘද්ධි නිලධාරීන් 70 ක් වශයෙන් 186 දෙනෙකු කාර්ය මණ්ඩල අනුමත කරගැනීමෙන් තොරව සේවයේ යොදවා තිබුණි.